Sample

00007

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව -6 වන මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය 2 - 2023/2024
LLU6715/LWU 4323 -කම්කරු නීතිය
කාලය පැය එකයි

දිනය- 2025.01.08 වේලාව- ප.ව 3.30 -ප.ව 4.30

මුළු ප්‍රශ්න ගණන - 02
එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.
අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. MBT මාධ්‍ය පුද්ගලික සමාගමෙහි සේවකයෝ, වැඩ කරන වේලාවේදී වෘත්තීය සමිති ක්‍රියාකාරකම්වල නිරත වීම තහනම් කරමින් අලුතින් හඳුන්වා දුන් සමාගම් ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන්, කළමනාකාරිත්වය සමග ආරවුලක් ඇති කරගෙන සිටිති. සමාගම් කළමනාකාරිත්වය එම ප්‍රතිපත්තිය වෙනස් කිරීමට අකමැති අතර කිසිදු ආකාරයේ සාකච්ඡාවකට එළඹීමද ප්‍රතික්ෂේප කරයි. එමනිසා එම ආරවුල කම්කරු කොමසාරිස්වරයාගේ මැදිහත් වීමෙන් විසඳා ගැනීමට සේවකයෝ කැමැත්තෙන් සිටිති.

කාර්මික ආරවුල් පනත යටතේ කම්කරු කොමසාරිස්වරයාගේ මැදිහත් වීමෙන් ඔවුන්ගේ ආරවුල විසඳා ගැනීම සඳහා අදාළ වන ක්‍රමවේදයන් මොනවාදැයි සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු මගින් තහවුරු කළ යුතුය.

(ලකුණු 20)

2. (අ) "කාර්මික ආරවුල් පනත යටතේ කාර්මික ආරවුලක් අනිවාර්ය බේරුම්කරණය සඳහා යොමු කිරීමට කම්කරු අමාත්‍යවරයාට අසීමිත අභිමතයක් පවතී."
ඔබ ඉහත ප්‍රකාශයට එකඟ වන්නේද? අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ අධිකරණ අර්ථනිරූපණ කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 12)

(ආ) ශ්‍රී ලංකාවේ 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත යටතේ 'සේවායෝජකයා' යන පදයට දී ඇති අර්ථනිරූපණය පැහැදිලි කරන්න.
එම අර්ථනිරූපණය මගින් පනත අදාළ කිරීමේ විෂයපථය පුළුල් කර ඇති බව ඔබ සිතන්නේද? අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

*හිමිකම් ඇවිරිණි*